**මිනිපේ ප්‍රාදේශීය සභාව - 2022**

-----------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මිනිපේ ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට මිනිපේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණන සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේ දී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේ දී, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේ ද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,

- සියබලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුළ සහ අදාළ නීති, රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ**.**

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත**.**

1.6 **මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

1.6.1 **ගිණුම්කරණ අඩුපාඩු**

| | **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභා කාර්යාල පරිශ්‍රයේ කොටසක් මහවැලි අධිකාරියට බදු දීමෙන් ඉකුත් වර්ෂය වෙනුවෙන් ලැබිය යුතු රු.150,000 ක් සමාලෝචිත වර්ෂයේ දී ගිණුම්ගත කිරීමේ දී, මහවැලි අධිකාරියෙන් ලැබිය යුතු කුලී ගිණුමට හර කළ ද, සමුච්චිත අරමුදල් ගිණුමට බැර කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේ දී නිවැරදි කරන බව | ගිණුම් නිවැරදි කළ යුතුය |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ ජ'නල් සටහන් මඟින් ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුමට රු.111,028 ක් බැර ලෙස දක්වා තිබුණ ද, අදාළ ලෙජර් ගිණුමට බැර කර නොතිබුණි. | -එම- | -එම- |
| (ඇ) | සමාලෝචිත වර්ෂයට අදාළ හසලක පැරණි උසාවි ගොඩනැගිල්ලේ පිහිටි කඩ කාමර 02 හි රු.216,000 ක් හා පැරණි රැස්වීම් ශාලාවේ රු.204,000 ක කුලී ආදායම් ගිණුම්ගත කර නොතිබුණි. | -එම- | ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය |
| (ඈ) | සභාවට අයත් සති පොළ 05 ක සමාලෝචිත වර්ෂයේ ආදායම රු.896,552 ක් වුවත්, එය රු.544,088 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | -එම- | -එම- |
| (ඉ) | සමාලෝචිත වර්ෂයට අදාළව ලැබිය යුතු ස්ථාවර තැන්පත් පොලී රු.323,216 ක් ගිණුම්ගත කර නොතිබුණි. | -එම- | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඊ) | ඉඩම් හා ගොඩනැගිලි ගිණුමෙන් ඉවත් කළ අංක 06 කඩ කාමරයේ වටිනාකම රු.250,000ක් ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුමට හර කළයුතු වුවත්, සමුච්චිත අරමුදල් ගිණුම හර කර තිබුණි. | -එම- | ගිණුම් නිවැරදි කළ යුතුය |
| (උ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීම හා සභාවේ ඇති ස්ථාවර වත්කම් ශේෂය අතර රු.325,826 ක වෙනසක් පැවතුණි. | මේ සම්බන්ධයෙන් සොයා බලා වාර්තා කරන බව | ගිණුම් ශේෂ නිවැරදි කළ යුතුය |
| (ඌ) | සභාවට අයත් මහජන පුස්තකාල 03 ක තීන්ත ආලේප කිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුළ දී, වැය කර තිබුණු රු.937,060 ක පුනරාවර්තන වියදම ප්‍රාග්ධනිත කර තිබුණි. | ඇස්තමේන්තු කරන ලද වියදම ලක්ෂ 14 ක් වන අතර, එම මුදල මේ වන තෙක් ගෙවා නොමැති බව | පුනරාවර්තන වියදම් ප්‍රාග්ධනිත නොකළ යුතුය |
| (එ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවේ ප්‍රධාන විදුලි බිල්පතින් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් භාවිතා කරන කොටසට අදාළව ලැබිය යුතු සියයට 40 ක මුදල වන රු.119,317 ක් ගිණුම්ගත කර නොතිබුණි. | 2023 වර්ෂයේ අවසාන ගිණුමට ඇතුළත් කරන බව | ලැබිය යුතු මුදල් ගිණුම්ගත කළ යුතුය |
| (ඒ) | සමාලෝචිත වර්ෂය ආරම්භයේ පැවැති රු.177,623 ක ලිපි ද්‍රව්‍ය තොග ශේෂය ගිණුමෙන් අත්හැරීම ගිණුම්ගත කිරීමේ දී, සමුච්චිත අරමුදල් ගිණුමට බැර කළ යුතු වුවත්, ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුමට බැර කර තිබුණි. | දෝෂයක් සිදු වී තිබෙන බව පිළි ගන්නා අතර, එය නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය |
| (ඔ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හසලක පුස්තකාලය ඉදිකිරීම වෙනුවෙන් කොන්ත්‍රාත්කරුට ගෙවිය යුතු මුදල රු.694,503 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | මේ සම්බන්ධයෙන් තොරතුරු සොයා බලා නිවැරදි කරන බව | -එම- |

1.6.2 **අවිනිශ්චිත ගිණුම්**

| **විෂය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල පැවැති රු.367,300 ක අවිනිශ්චිත ගිණුම් ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම අවිනිශ්චිත ගිණුමේ ශේෂයන් පිළිබඳව තවදුරටත් සොයා බලා නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව | ගිණුම් නිවැරදි කළ යුතුය |

1.6.3 **විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.8,465,632 ක් වටිනා ගිණුම් ශේෂ 03 කට අදාළ උප ලේඛන, ලේඛන සහ ලිපි ගොනු ඉදිරිපත් නොකිරීම හේතුවෙන් සතුටුදායක ලෙස පරීක්ෂා කළ නොහැකි විය. | ආදායම් ණයගැතියෝ, පෙර පාසැල් ගාස්තු හා තැන්පතු සම්බන්ධයෙන් තවදුරටත් සොයා බලා වාර්තා කරන බව | ගිණුම් ශේෂ සනාථ කර ගැනීමට අවශ්‍ය උපලේඛන සාක්ෂි පවත්වා ගත යුතුය |

1.7 **අනුකූල නොවීම්**

**නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම්**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | **නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව** | **අනුකූල නොවීම** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති අංක 59 හා 60 | බල ප්‍රදේශයේ වෙළඳ බලපත්‍ර, ව්‍යාපාර බදු හා කර්මාන්ත බදු අය කරනු ලබන ව්‍යාපාර ආයතන පිළිබඳ සමීක්ෂණයක් සිදු කර ලැයිස්තුවක් පිළියෙල කර නොතිබුණි. | ආදායම් පරීක්ෂක පුරප්පාඩුව පවතින බැවින්, සමීක්ෂණය සිදු කළ නොහැකි විය. ඉදිරියේ දී සමීක්ෂණ කටයුතු සිදු කර වාර්තා කරන බව. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය |
| (ආ) | 2008 ජනවාරි 25 දිනැති අංක 1533/16 දරන අති විශේෂ ගැසට් පත්‍රය | කාලය ඉකුත් වූ පරිසර ආරක්ෂණ බලපත්‍ර 173 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | කර්මාන්ත බොහෝමයක පවතින ආර්ථික තත්ත්වය හමුවේ අක්‍රිය තත්ත්වයේ පවතින අතර, අනෙකුත් කර්මාන්ත සඳහා සිහි කැඳවීම් යවා ඇති බව. | ගැසට් නිවේදනය අනුව කටයුතු කළ යුතුය |

2. **මූල්‍ය සමාලෝචනය**

2.1 **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.12,284,008 ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.12,014,634 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| **(i)** | වරිපනම් හා බදු | 1,335,885 | 1,333,672 | 848,500 | 2,832,967 | 1,404,884 | 1,333,672 | 794,356 | 2,347,795 |
| **(ii)** | කුලී | 7,592,442 | 5,627,771 | 4,187,388 | 14,109,443 | 6,039,300 | 6,000,818 | 670,139 | 12,669,060 |
| **(iii)** | බලපත්‍ර ගාස්තු | 1,717,000 | 1,360,008 | 1,279,477 | 221,156 | 1,898,500 | 1,586,407 | 1,672,282 | 140,625 |
| **(iv)** | වෙනත් ආදායම් | 12,609,000 | 16,147,595 | 10,114,377 | 15,616,900 | 45,259,720 | 46,449,226 | 32,938,195 | 9,583,682 |
| | එකතුව | 23,254,327 | 24,469,046 | 16,429,742 | 32,780,466 | 54,602,404 | 55,370,123 | 36,074,972 | 24,741,162 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය** | | |
| සමස්ත ආදායම් ප්‍රභවයන්ගෙන් 2021 දෙසැම්බර් 31 දිනට පැවති හිඟය රු.24,549,381 ක් වූ අතර, සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට එම වටිනාකම රු.32,780,466 ක් වීම හේතුවෙන්, හිඟ ආදායම්වල වර්ධනය සියයට 34 ක් විය. | මේ වන විට විධිමත් වැඩපිළිවෙලක් යටතේ ආදායම් රැස් කිරීමේ කාර්යය සිදු කරන බැවින්, ඉදිරියේ දී එහි ප්‍රගතිය ඉදිරිපත් කරන බව. | හිඟ ආදායම් අය කර ගත යුතුය. |
| **(ආ) වරිපනම්** | | |
| වරිපනම් ඒකකයක හිඟය රු.10,000 ඉක්ම වූ දේපළ 31 කින් අය විය යුතු රු.711,407 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අය කර නොතිබුණි. | අය විය යුතු වරිපනම් බදු සම්බන්ධයෙන් සොයා බලා අය කර ගැනීමට කටයුතු කරන බව. | පනතේ විධිවිධාන අනුව කටයුතු කර හිඟ අය කළ යුතුය. |
| **(ඇ) ජල බදු** | | |
| ජල ව්‍යාපෘති 10 ක ජල සම්බන්ධතාවය විසන්ධි කර තිබුණු ජල පාරිභෝගිකයින් 225 කගෙන් අය | මේ සම්බන්ධයෙන් විධිමත් වැඩපිළිවෙලක් සකස් කර | හිඟ ආදායම් අය කර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | විය යුතු රු.549,635 ක් සහ සභාව විසින් නඩත්තුවෙන් තොරව අතහැර දමා ඇති ජල ව්‍යාපෘති 02 කින් අය කර ගත යුතු රු.53,365 ක මුදලක් ද අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ක්‍රියාත්මක කරමින් පවතින බව. | |
| (ඇ) | **කුලී** | | |
| | ප්‍රාදේශීය සභාව සතු වෙළඳ සංකීර්ණ 08 ක කඩ කාමර 47 ක් හා ජංගම වෙළඳ කුටි 04 ක් කුලියට දී තිබුණු අතර, ඒවායේ කුලී කාලීනව අය නොකිරීම හේතුවෙන්, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.12,605,834 ක හිඟයක් පැවතුණි. | දීර්ඝ කාලයක් තිස්සේ ආදායම් පරීක්ෂක පුරප්පාඩුවක් සමඟ ආදායම් රැස් කිරීම ප්‍රමාද වූ බව. | හිඟ කඩ කුලී අය කර ගැනීමට හෝ නීතිමය පියවර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථාපනය කර ඇති දැන්වීම් පුවරු සමීක්ෂණයක් සිදු කර ගාස්තු අය කළ යුතු වුව ද, මොරයාය පාර පිහිටි දැන්වීම් පුවරු 27 කින් රු.81,975 ක ගාස්තු අය කර නොතිබුණි. | සමීක්ෂණයක් සිදු කර අදාළ ගාස්තු අය කර ගැනීමට කටයුතු කරන බව. | ආදායම් අය කර ගත යුතුය. |
| (ඊ) | **උසාවි දඩ හා මුද්දර ගාස්තු** | | |
| | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2022 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.9,299,390 ක් හා මුද්දර ගාස්තු රු.1,003,650 ක් අය වියයුතුව තිබුණි. | උසාවි දඩ හා මුද්දර ගාස්තු අය කර ගැනීම සම්බන්ධයෙන් කටයුතු කරමින් පවතින බව. | උසාවි දඩ හා මුද්දර ගාස්තු කඩිනමින් ගෙන්වා ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 28 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත්, 2022 දෙසැම්බර් 31 දින වන විට කාරණා 03 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි. | සභාව මගින් අතුරු ව්‍යවස්ථා 03 ක් පනවා ඇති බව | පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය |

3.2 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අනවසරයෙන් ඉදිකළ අත්තිවාරමක් කඩා ඉවත් කිරීම නිසා, සිදු වූ අලාභය වූ රු.24,710 ක් වෙනුවෙන් අදාළ පුද්ගලයා රු.500,000 ක අලාභයක් ඉල්ලා පැවරූ නඩුව වෙනුවෙන් රු.530,500 ක මුදලක් ගෙවන ලෙස ඒක පාර්ශවික තීරණයක් ලබා දී සභාව විසින් පැමිණිලිකාර පාර්ශවයට 2018 වර්ෂයේ දී රු.530,500 ක වන්දි මුදල ගෙවා තිබුණු අතර, මෙම නඩුව වෙනුවෙන් සභාව සතු කැබ් රථය වසර 15 කට අධික කාලයක් නඩු භාණ්ඩයක් ලෙස ගාල් කර තිබීම හේතුවෙන්, රු.843,700 ක අලුත්වැඩියා වියදම සමඟ රු.1,374,200 ක අලාභයක් සිදු වී තිබුණි. මෙම අලාභයෙන් රු.530,500 ක අලාභය මු.රෙ.104(04) පරීක්ෂණයෙන් පුද්ගලයින් 04 දෙනෙකුගෙන් රු.134,950 ක් බැගින් අය කිරීමට නිර්දේශ කර තිබුණ ද, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අය කර නොතිබුණි. | මු.රෙ.104(4) පරීක්ෂණය පවත්වා ඒ සඳහා වගකිවයුතු පුද්ගලයින් 04 දෙනෙකු නම් කොට ඇත. අදාළ අය වෙත ලිපි ඉදිරිපත් කර ඇති අතර, ඉදිරියේ දී එම අය කිරීම් අය කර වාර්තා කරන බව | පරීක්ෂණ වාර්තාවට අනුව අලාභ අය කළ යුතුය |

3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හසලක වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 20 ක හිඟ කාමර කුලිය රු.9,674,763 ක් වී තිබුණු අතර, වසර 10 ක පමණ සිට බදුකරුවන් බදු කුලී ගෙවා නොතිබුණි. සියලුම කඩ කාමර සඳහා 2009 වර්ෂයෙන් පසු ගිවිසුම්ගතවීමට කටයුතු කර නොතිබුණු අතර, සියලුම කඩ කාමරවල පිටුපසට අනවසර ඉදිකිරීම් සිදු කර කඩය පිටුපස ස්ථිරව පදිංචි වී සිටින බවත්, බදුකරුවන් ඉහළ මහලයේ අනවසරයෙන් ඉදිකිරීම් කර තිබුණි. | මේ වන විට පළාත් පාලන කොමසාරිස් මගින් බදුකරුවන් ඉවත් කිරීම සම්බන්ධයෙන් නඩු කීපයක් පැවරීම සිදු කරන බව | ඉඩමේ අයිතිය පවරා ගෙන විධිමත්ව ගිවිසුම්ගත විය යුතු අතර, අනවසර ඉදිකිරීම් ඉවත් කිරීම හා කඩ කුලී කාලීනව අය කළ යුතුය |

3.4 **නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසාන දිනට එකතුව රු.1,978,050 ක වාහන 03 ක් වර්ෂ 08 ක පමණ කාලයක සිට ධාවන තත්ත්වයේ නොපවතින අතර, මෙම වාහන අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ සුදුස්සක් කිරිමට කටයුතු කර නොතිබුණි. | කැබ් රථය අලුත්වැඩියා කිරීමටත්, ට්‍රැක්ටරය හා ට්‍රේලරය වෙන්දේසි කිරීමට නිර්දේශ ලබා ගැනීමට ඉදිරිපත් කරන බව | අලුත්වැඩියා කළ හැකි වාහන අලුත්වැඩියා කිරීමටත්, අනෙක් වාහන අපහරණය කිරීමටත් කටයුතු කළ යුතුය |

3.5 **වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව සතු රු.139,278,220 ක ඉඩම් හා සුසාන භූමි 59 ක අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | සභාව සතු වත්කම් පවරා දෙන ලෙස ඉල්ලා නිරන්තරයෙන් අදාළ ආයතන දැනුවත් කර ලිපි යොමු කර ඇති බව | ඉඩම්වල අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුය |
| (ආ) | පුර නැඟුම ව්‍යාපෘතිය යටතේ රු.71,949,560 ක් වැය කර ඉදිකළ බහු කාර්යය ගොඩනැගිල්ලේ දෙවන මහලේ වර්ග අඩි 7,000 ක ප්‍රමාණය සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත්, කිසිදු ප්‍රයෝජනයක් නොගෙන නිෂ්කාර්යයව පැවතුණි. | ප්‍රාදේශීය සභාවේ ආදායම පසුගිය වසර 03 තුළ රටෙහි පැවැති ආර්ථික තත්ත්වය හමුවේ තවදුරටත් අඩු විය. එබැවින්, සංවර්ධන කටයුතු සඳහා මුදල් වෙන් කිරීමට නොහැකි විය | ගොඩනැගිලි ඵලදායී කාර්යයකට යොදා ගත යුතුය |

3.6 **කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **ජලය බැස යන කාණුව සංවර්ධනය - රු.425,388** | | |
| | මෙම ව්‍යාපෘතියේ, ඇස්තමේන්තුවේ වැඩ විෂයය 03 ට අනුව, හැඩයම් ගැසීම HSR ST – 57 ප්‍රකාරව වර්ග මීටරයකට රු.1,587 ක් බැගින් වර්ග මීටර් 79.58 ක් සඳහා රු.126,325 ක් ඇස්තමේන්තු කර ඇතත්, HSR ST – 112 ප්‍රකාරව කාණු පැතිවලට අදාළ හැඩයම් ගැසීම (Shuttering) සඳහා රු.830 ක රේටයක් හඳුන්වා දී තිබිය දී, වැඩියෙන් හඳුනාගත් රේටය මත කොන්ත්‍රාත්කරුට හැඩයම් ගැසීමට (Shuttering) ගෙවීම් කිරිම හේතුවෙන්, රු.60,257 ක් වැඩිපුර ගෙවා තිබුණි. | වැඩිපුර ගෙවා ඇති රු.60,257 ක මුදල කොන්ත්‍රාත්කරුගෙන් අය කර ගැනීමට ලිපි ඉදිරිපත් කර ඇති බව | ඉටු කළ වැඩ සඳහා පමණක් ගෙවීම් කළ යුතු අතර, වැඩිපුර ගෙවීම් නිර්දේශ කළ නිලධාරීන් හඳුනා ගෙන ක්‍රියාමාර්ග ගත යුතුය |

**(ආ) හසලක මහජන පුස්තකාලයේ අලුත්වැඩියාව - රු.5,001,755**

| | | | |
|---|---|---|---|
| (i) | 2021 සැප්තැම්බර් 29 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ සීමාව ඉක්මවා එකතුව රු.5,001,755 ක වටිනාකමකට ව්‍යාපෘතිය, ව්‍යාපෘති 02 ක් ලෙස පිරිනමා තිබුණි. මේ හේතුවෙන්, ටෙන්ඩර් පරිපාටිය අනුගමනය කර, තරඟයකට යොමු කර අවම පිරිවැයකට කොන්ත්‍රාත්තුව ඉටු කිරීමේ වාසිය අහිමි වී ගොස් තිබුණි. | හසලක මහජන පුස්තකාලය අලුත්වැඩියාව සඳහා අප සභාව මඟින් ප්‍රතිපාදන දෙකක් යටතේ ඇස්තමේන්තු දෙකක් සකස් කර චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ බව | ප්‍රතිපාදන මුදල් පවතින විට ගොඩනැගිලි ඉදි කිරීමේදී මුළු පිරිවැය ඇස්තමේන්තුව මත ප්‍රසම්පාදනය කළ යුතුය. |
| (ii) | ගොඩනැගිලි සම්මත රේටය (BSR) අනුව, රුපියල් මිලියන 05 ඉක්ම වන කොන්ත්‍රාත්තු සඳහා භාවිතා කරන රේටය භාවිතා නොකර රුපියල් මිලියන 05 ට අඩු කොන්ත්‍රාත් සඳහා භාවිතා කරන රේටය භාවිතා කිරීම නිසා, සභා අරමුදලට රු.286,589 ක පාඩුවක් සිදු කර තිබුණි. | භාවිතා කරන ලද රේටයන් නිවැරදි බව | රුපියල් මිලියන 50 ඉක්මවීමේ දී, BSR අනුව භාවිතා කළ යුතු රේටයන් භාවිතා කළ යුතුය |
| (iii) | සීමාසහිත විවිධ සේවා සමුපකාර සමිතිය සමඟ 2022 දෙසැම්බර් 30 දින අත්සන් කළ ගිවිසුම් දෙකෙහිම 03 වගන්තියේ කර්මාන්තය සම්පූර්ණ කොට භාර දෙන දිනය පිළිබඳව දක්වා නොතිබුණු අතර, 2023 අප්‍රේල් 06 දින වන විටත් ව්‍යාපෘතිය සම්පූර්ණ කර නොතිබුණි. | ආරම්භ කළ දිනයේ සිට මාස 03 ක කාලයක් ලබා දී ඇති අතර, අමතර ගත වන කාලය සඳහා ප්‍රමාද ගාස්තු අය කර ගන්නා බව | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුය |